

# මැයි දින අසිරිය නොහොත් බක්මහ ඔස්සේ අතීතයට යාමක්

1946 වසරේ මැයි දින පෙළපාලියේ "සාදුකින් පෙළෙනවුන් ..." යනුවෙන් මොර ගසමින් ගමන් තළ මට වසර කීපයකින්වත් හරි හමන් මැයි දින පෙළපාලියක් දැක ගත නොහැකි විය. 2016 මැයි දිනයට අර අඳින නෙයෙකුත් පක් හා පුද්ගලයන්ගේ කතා ඇසූවත් මැයි දිනට කලින් මට මවුබිමෙන් පිටවන්නට සිදුවිය. ඒ නිසා මම අතීත දර්ශන හා අත්දැකීම් සිහිපත් කරමින් සිත සනසා ගන්නට බලමි.

මෙවර පූර්ව ප්‍රචාර අතර ප්‍රධාන සිරස්තලය වූයේ එජාප මැයි දින පෙළපාලියට ප්‍රදර්ශන රථ 500 ක් සහභාගි වීමය. මට එක්වරටම මතක් වූයේ 1970 බලයට පත් රජය යටතේ ඉදිරිපත් කළ විචිත්‍ර කාර්මික සංස්ථා ප්‍රදර්ශන (ප්‍රචාරක) රථ පෙරහැර ය. ඒ රථ සියල්ලම සපිරිවරින් අනුරාධපුර බලා පිටත් වන්නට කලින් සිදු වූ සුළු සිද්ධියක්ද මට මතකය. ඔය ගමනට ඔය තරම් සේවක පිරිසක් අරන් යන්නේ ඇයි දැයි මා ඇසූ ප්‍රශ්නයට වානේ සංස්ථාවේ ඒ කටයුතු බාරව සිටි විජේරත්න වරකාගොඩ මට දුන් උත්තරයයි - තරවටුවයි. හැම සංස්ථාවක්ම කළේ හැකි තරම් පිරිසක් අනුරාධපුරය වැඳ ගැනීමට ඉඩ සළසා දීමය. යන වියදම ගැන සිතීම අද වගේම එදත් සිරිත නොවී ය.

"මැයි දිනයට කොළ කොයින් ද?" කියපු යුගය දැන් හමාර වෙලා ය. අද පවත්වන මැයි දින පෙළපාලි සහ රැලි වෛවර්ණයෙන් අලංකාර කරන ලද සැණකෙළි ස්වරූපයක් ගන්නේය. එදා චුම්බි - බොතේජු - ගෝල් ෆේස් හෝටලයේ වේටර් කෙනෙකු විසින් ඩබ්ලිව් ජේ පෙරේරා වැනි කම්කරුවන්ගේ වැඩට මුල් තැන දුන් මැයි දින වේදිකාව අද ජනප්‍රිය ගායක වාදක නර්තන පිරිස් වලට ඉඩ සලසන රංග පීඨයක් බවට පත්ව ඇත.

මැයි දින අසිරිය වර්තමානය ඔස්සේ අතීතයට ගමන් කිරීමක් ලෙසින් මා හඳුන්-වන්නේ අන්න ඒ සුපිරි ලක්ෂණ හේතු කොට ගෙනය. අපි 1927 වසර තෙක් දුර අතීතයට යමු. ශ්‍රී ලංකාවේ ප්‍රථම මැයි දින සැමරීම පිළිබඳ ගෞරවය හිමි වන්නේ ඒ වසරේ එය ඉටු කළ දිවයිනේ පළමු කම්කරු නායකයා සහ පළමු දේශපාලන පක්ෂ (කම්කරු පක්ෂ) නායකයා ද වූ ඒ ඊ ගුණසිංහටය. සකලාංග සම්පූර්ණ ප්‍රථම මැයි දින පෙළපාලිය (ඔහු ඒ වචනය භාවිත කළා දැයි මට නිච්චි නැත) සහ රැලිය පැවැත්වීම ද ඔහුගේ නායකත්වයෙන් සිදු වූයේ 1933 දී ය. පසුව ලසසපයේ ගොදුරු බිමක් බවට පත් වූ ප්‍රයිස්

**<u>පටන් ගැන්මේදී රතු ඇඳගත් නායකයන් දීපු පොරොන්දු හා අනාගත ශ්‍රී විභූතිය මවා පෑමට අද නිල් කොළ දෙපාටම ඇඳ ගත්තවුන් ද සමත්ව ඇත.</u>**

පාක් පිටියේ ඇරඹුණු පෙරහැරගාලු මුවදොර තෙක් ගමන් කොට රැලිය එහිදී පවත්වන ලදී.

සිවයිනේ ප්‍රථම වැඩ වර්ජනය (බවුස්ටඩ් සමාගම විසින් පවත්වාගෙන ගිය කොළඹ ට්‍රෑම් රිය පදවන්නන්ගේ වැඩ වර්ජනය) එජාපයට ආඩම්බර වීමට කරුණක්ද ඉදිරිපත් කරන්නක් විය. ට්‍රෑම් රිය නොමැති නිසා කොටුව බොරැල්ල අතර යන මගීන්ට ප්‍රවාහන පහසුව සැපයූ එක් නීති ශිෂ්‍ය යෙක් තමාගේ රියෙන් ඒ මගීන් ගෙන යාමට-ඉදිරිපත් වූයේ ය. ඔහුගේ නම ජේ ආර් ජයවර්ධන ය.

1933 මැයි දින පෙරහැරට ඇතුළත් කරන ලද අංග ද නායකයා විසින් ම තීරණය කරනු ලැබී ය. ඔහු විසින් ම පුහුණු කරන ලද පොලිස් (සැබෑ පොලිස් නොවේ) වාදක කන්-ඩායමක් පෙරමුණටම. බෙර දවුල් වයන අය සමග වයිවාරන්න නැටුම් ඉදිරිපත් කරන



**කම්කරු නායක ඒ ඊ ගුණසිංහ**

නැට්ටුවෝ ය. ගැහැනු පිරිමි කම්කරු පිරිස විශේෂ ඇඳුමින් සැරසී සිටියෝ ය. සුදු සරම ඇඳගත් පිරිමි රතු ඉරි වැටුණු කමිස පැළඳගෙන ය. රතු සැට්ට සහ රෙදි හෝ ගවුම් ඇඳගත් කාන්තාවෝ ය.

පසු කලෙක විවියන් ගුණවර්ධන බඳු

**<u>සුදු පාලකයන් විසින් වයස 21 න් ඉහළ පිරිමින්ට පනවා තිබුණු ඇඟ බද්දට එරෙහිව අනුගාමික පිරිසක්ද සමග මහ පාරේ ගල් කැඩීමට ඉදිරිපත් වූ කම්කරු නායකයාට සිරබත් කෑමට පවා සිදුවිය.</u>**

නායකයන් හඬ නගා ගායනා කළ -

"බණ්ඩට පිට කොන්දක් නැහැ
තියෙන අපට දෙන්නෙත් නැහැ"

වාගේ ක්‍රෝධයෙන් හා සටන් කාමයෙන් පිරී ගිය උද්‍යෝග පාඨ හෝ ඇණුම් බැණුම් කිසිවක් ගුණසිංහගේ මැයි දින පෙරහැරේ දක්නට නොතිබිණි. ගී ගයමින් - සබකෝලයෙන් ගමන් කරන සාමකාමී කම්කරු ජනතාවකගේ පෙරහැරකි. එදා 1933 දී පවත්වන ලද්දේ ශ්‍රී ලංකාවේ ප්‍රථම ගෝල්ෆේස් මැයි දින රැලිය යි.

1935 දී බිහිවුණු ලසසප ය මෙන් ඒ ඊ ගුණසිංහ ගේ කම්කරු පක්ෂය අනාගත කම්කරු රජයක් ගැන දේශනා පැවැත්වූයේ නැත. විප්ලවයක් ගැන කතා කළේද නැත. එම නායකයන්ට වුවමනා වූයේ දුප්පත් කම්කරුවාට පමණක් නොව සෙසු දුගීන්ටද සහනයක් සැලසීමය. ඒ පිළිබඳ හොඳම නිදසුන අද ගුණසිංහ පුරයට පිවිසෙන තැනම ඉදි කොට ඇති ඔහුගේ ප්‍රතිමාව ය. අපරදිග ඇඳුමින් සැරසුණ දැවැන්ත පුද්ගලයා දෝතින් ඔසොවා ගත් කුළුගෙඩිය සංකේතයක් බව එය දකින කී දෙනෙක් දනිත් ද? විශ්වාස කරත් ද?

සුදු පාලකයන් විසින් වයස 21 න් ඉහළ පිරිමින්ට පනවා තිබුණු ඇඟ බද්දට එරෙහිව අනුගාමික පිරිසක්ද සමග මහ පාරේ ගල් කැඩීමට ඉදිරිපත් වූ කම්කරු නායකයාට සිරබත් කෑමට පවා සිදුවිය. එහෙත් ඒ බද්ද ඉවත් කර ගැනීමට ඔහුගේ සටන සමත් වූ බවද කිව යුතු ය.

වර්තමානය ඔස්සේ අතීතයට ගමන් කළ විට දක්නට ලැබෙන දර්ශනය ඔන්න ඔය වාගේ එකක් ය. අද මැයි දින වේදිකාවට පිවිසෙන බොහෝ දෙනා යටි ගිරියෙන් කෑ ගසන්නේ 1947 හොරණ තක්ෂිලා විද්‍යාල ශාලාවේ මන්ත්‍රී ඒ පී ජයසූරිය ගේ සභාපතිත්වයෙන් පවත්වන ලද රැස්වීමේදී චුම්බි සහෝදරයා (එච් එල් පෙරේරා) කතා කරපු විලාසයට ය. සිරගතව සිටි ලසසප නායකයන් නිදහස් කළ යුතු බවට කීමට පැවැත් වූ ඒ රැස්වීම අමතමින් චුම්බි කළ නිර්භීත ප්‍රකාශය මෙබඳු ය.

"අපේ සහෝදරයන් වහාම නිදහස් නොකළොත් අපි බදුල්ලේ සිරගෙදර මුරුක්කු මසල වඩේ




වගේ පොඩි කරලා ඔවුන් එළියට ගන්නවා"

අපි අත් රිදෙන තෙක් අත්පුඩි ගැසූ හැටිද මට මතක ය.

අද පවා අහිංසක ජනතාව අත් පොළසන් දෙමින් සවන් දීගෙන සිටින්නේ ද දුම්බිගේ කතාවට නොදෙවෙනි අභීත ප්‍රකාශයන්ටය. අනන්ත පොරොන්දු වලටය. අභියෝග වලටය. පටන් ගැන්මේදී රතු ඇඳගත් නායකයන් දීපු පොරොන්දු හා අනාගත ශ්‍රී විභූතිය මවා පෑමට අද නිල් කොළ දෙපාටම ඇඳ ගත්තවුන් ද සමත්ව ඇත.

ඔවුන්ගේ සුමිහිරි වදන් අසාගෙන අත් පොළසන් දීම තව කලක් යනතුරු දිගටම සිදුවනු සිකුරු ය.